// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2164/66 - 2020 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා - 2020.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

15 (1) වැනි වගන්තිය යටතේ නියමය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 (1) වගන්තිය යටතේ, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එවකට 1990 මාර්තු මස 21 වැනි දින අංක 602/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දී තිබූ මෙහි පහත I උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති, නුවරඑළිය මහා නගර සභාවට අයත්ව තිබූ ඉඩමෙන් කොටසක් වන මෙහි II උපලේඛනයේ සඳහන් ඉඩම, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හරහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත පැවරීම පිණිස නිදහස් කරන අතර, ඉතිරි ඉඩම් ප්‍රමාණය වන මෙහි III වන උපලේඛනයේ සඳහන් හෙක්ටයාර් 2.135 ක ප්‍රමාණය සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතුව තවදුරටත් පවත්වා ගනු ලබන බව දැනුම් දෙමි.

මහින්ද රාජපක්ෂ (පා.ම.),
නාගරික සංවර්ධන, ජලසම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 පෙබරවාරි මස 24 වැනි දින,
17 හා 18 වන මහල්,
''සුහුරුපාය''
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජලසම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ දී ය.

### I උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය උපදිසාපති කොට්ඨාසයේ, නුවරඑළිය මහනගර සභා සීමාව තුළ උද්‍යාන පාර, අංක 07 දරන නාගරික කොට්ඨාසයේ මුන් ජලේන්හි පිහිටියා වූ ද මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක මු.පි.නු. 1378 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 01 වශයෙන් දක්වා ඇත්තා වූ පහත සඳහන් මායිම් වලින් යුත් ඉහළ වැව පාර නැමති හෙක්ටයාර් 2.192 කින් යුත් ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | හියුජේ ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම සහ නුවරඑළිය මහනගර සභාව සතු ඉඩම ; |
| *නැගෙනහිරට* | - | ඉහළ වැව පාර සහ නුවරඑළිය මහනගර සභාව සතු ඉඩම ; |
| *දකුණට* | - | නුවරඑළිය මහනගර සභාව සතු ඉඩම සහ අංක මු.පි.නු. 1378 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 02 ; |
| *බටහිරට* | - | අංක මු.පි.නු. 1378 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 02 හා හියුජේ ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම සතු ඉඩම. |

1A - G 32126 — 20 (2020/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### II උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය උපදිසාපති කොට්ඨාසයේ, නුවරඑළිය මහනගර සභා සීමාව තුළ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක මු.පි.නු. 1378 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 01 හි පහත මායිම් තුළ පිහිටියා වූ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හරහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත පැවරීම පිණිස නිදහස් කරන හෙක්ටයාර් 0.0572 ක ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | හියුජේ ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම සහ නුවරඑළිය මහනගර සභාව සතු ඉඩම ; |
| *නැගෙනහිරට* | - | ඉහළ වැව පාර සහ නුවරඑළිය මහනගර සභාව සතු ඉඩම ; |
| *දකුණට* | - | අංක මු.පි.නු. 1378 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 01 දරන ඉඩමේ ඉතිරි ඉඩම ; |
| *බටහිරට* | - | හියුජේ ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම සතු ඉඩම. |

### III උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය උපදිසාපති කොට්ඨාසයේ, නුවරඑළිය මහනගර සභා සීමාව තුළ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක මු.පි.නු. 1378 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 01 හි උතුරු මායිම ඔස්සේ හෙක්ටයාර් 0.0572 ක ප්‍රමාණය ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හරහා රාජ්‍ය ආරක්ෂක අමාතශාංශය වෙත නිදහස් කිරීමෙන් පසුව කැබලි අංක 01 හි ඉතිරි වන හෙක්ටයාර් 2.135 ක ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | - | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හරහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත නිදහස් කරනු ලබන ඉඩම සහ නුවරඑළිය මහනගර සභාව සතු ඉඩම ; |
| *නැගෙනහිරට* | - | නුවරඑළිය මහනගර සභාව සතු ඉඩම ; |
| *දකුණට* | - | අංක මු.පි.නු. 1378 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 02 සහ නුවරඑළිය මහනගර සභාව සතු ඉඩම ; |
| *බටහිරට* | - | අංක මු.පි.නු. 1378 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 02 හා හියුජේ ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම සතු ඉඩම. |

# මූලික පිඹුර නු 1378
# P. PLAN

පරිමාණය 1 : 4000
SCALE

ගම / VILLAGE: මුත්රලේන් - (කොටසක් අංක 7 හරස්පේ නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ)

ග්‍රාම නිලධාරී කොට්ඨාශය: ඔය පලාත කෝරලේ

ප්‍රා. ආ. නි. කොට්ඨාශය / D. R. O'S DIVISION: නුවරඑළිය

දිස්ත්‍රික්කය / DISTRICT: නුවරඑළිය

පළාත / PROVINCE: මධ්‍යම


මැනීමේ නියමය / Reqn. for Survey: (ස. ර. යේ අංකය: නු/මි/90/025) කා. සං. දු. මි. අංක 10/3/221 සහ 1990.02.13 දින

පි. අංකය / P. No.: M/6 3S

ක්ෂේ. පු. අංකය / F. B. No.: 69/1/3

ලේඛ. පරි. අංකය / F. B. No: නු 2802

විස්තරය / Reference
ග - මායිම් ගල
ඉ - ඉවුර
නාවි: කම්බි වැට




හෙක්ටයාර 1 = අක්කර 2.47
1 Hectare = 2.47 Acres

| ඉඩම් කැබැල්ල Lot | නම Name | විස්තරය Description | හිමිකම් කියන්නාගේ නම Name of Claimant | හෙක්ටයාර Hectares | රේඛා චිත්‍රය Diagram | කියයුතු කරුණු Remarks |
|---|---|---|---|---|---|---|
| | ඉහල වැව පාර ඉඩම | ඵතත | නුවරඑළිය මහ නගර සභාව | 2·192 | | 42 වැනි නගර මැනුම් සිතියමේ පත්‍ර අංක 20 සහ 21 හි කැබලි අංක 17 හි කොටසක්<br>මායිම් උපලේඛනය:<br>උතුරට: කිපුරේ ඉන්වර්නැසකල් සමාගම සහ නුවරඑළිය මහ නගර සභාව සතු ඉඩම්<br>නැගෙනහිරට: ඉහල වැව පාර සහ නුවරඑළිය මහ නගර සභාව සතු ඉඩම<br>දකුණට: නුවරඑළිය මහ නගර සභාව සතු ඉඩම සහ කැබලි අංක 2<br>බටහිරට: කැබලි අංක 2 සහ කිපුරේ ඉන්වර්නැසකල් සමාගම සතු ඉඩම.<br>නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීම සඳහා |
| 2 | ඉහල වැව පාර ඉඩම | ඵතත | නුවරඑළිය මහ නගර සභාව | 0·056 | | 42 වැනි නගර මැනුම් සිතියමේ පත්‍ර අංක 20 හි කැබලි අංක 17 හි කොටසක් ඇළ දියේ වෙන් කල බිම ( එ.ඩී.560 ) |
| | | | එකතුව | 2·248 | | |

මැනීම හා ඇඳීම කළේ / Surveyed and Drawn by: (Nimal Liyanage) නිමල් ලියනගේ, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු තැන / Surveyor, Survey Department

1990 පෙබරවාරි මාසයේ 19 දින / in

මායිම් පෙන්වා දුන් අය / Boundaries pointed out by
මායිම් බලාගත් අය / Boundaries pointed out to
වී. රයසුරිය, කිපුරේ ඉන්වර්නැසකල් සමාගම, නුවරඑළිය.

පරීක්ෂා කළේ / Checked by: ඩබ්. ඒ. එස්. වික්‍රමආරච්චි (W. A. S. Wickkramaarachchi) (Asst. S.S.) (ස.මි.අ.) 1990-02-02

ඩී. එම්. ගුණරත්න
මහා භාර මිනුම් අධිකාරි / Supdt. of Surveys
මිනින්දෝරු ජනරාල් වෙනුවට / On behalf of the Surveyor General
නුවරඑළියේ දී ... දින at



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.